වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**Provincial Department of Education - NWP**

## පෙරහුරු පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2024

## චිත්‍ර කලාව - I පත්‍රය

විභාග අංකය :..................................

කාලය පැය - 3 යි

උපදෙස් :-

- මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් සමන්විත වේ.

  I කොටස - වරණ 5 බැගින් බහුවරණ ප්‍රශ්න 40 කි. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු මෙම පත්‍රයේම සපයන්න.

  II කොටස- මෙම කොටස ''අ'', ''ආ'',''ඉ'' යනුවෙන් කොටස් තුනකින් සමන්විත වේ. ''අ'' කොටසින් ප්‍රශ්න දෙකක් හා ''ආ'' සහ ''ඉ'' කොටස්වලින් එක් ප්‍රශ්නය බැගින් තෝරාගෙන ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න. එක් ප්‍රශ්නයකට ලකුණු 15 බැගින් ලකුණු 60 කි.
- I කොටස හා II කොටස අදාළ පිළිතුරු එකට අමුණා භාරදෙන්න.

### I – කොටස

- **අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවලට වඩාත් යෝග්‍ය පිළිතුරු පහත සඳහන් A, B, C,D,E යන ඡායාරූප ඇසුරින් තෝරන්න.**


A


B


C


D


E

01. A. අක්ෂරයෙන් දැක්වෙන කැටයම.
    1. ඉසුරුමුණි කෞතුකාගාරයේ දක්නට ලැබේ.
    2. ඉසුරුමුණි විහාරය අසළ පිහිටි රන්මසු උයනේ දක්නට ලැබේ.
    3. ඉසුරුමුණි විහාරයේ ජල පොකුණ ආසන්නයේ පර්වතය තුළ දක්නට ලැබේ.
    4. ඉසුරුමුණි ජලපොකුණේ ගල්තලය මත දක්නට ලැබේ.
    5. ඉසුරුමුණි විහාරයේ පිහිටි ගලක දක්නට ලැබේ.

02. B. අක්ෂරයෙන් දැක්වෙන අර්ධ උන්නත කැටයම.
    1. අනුරාධපුර බිසෝමාලිගයෙන් හමු වී ඇත.
    2. අනුරාධපුර ථූපාරාම චෛත්‍යය අසළින් හමුවී ඇත.
    3. පොළොන්නරු වටදාගෙය අසළින් හමුවී ඇත.
    4. අනුරාධපුර අභයගිරි චෛත්‍යය අසළින් හමුවී ඇත.
    5. අනුරාධපුර රත්න ප්‍රාසාදය අසළින් හමුවී ඇත.

03. C. අක්ෂරයෙන් දැක්වෙන පොකුණ.

1. ඉසුරුමුණි විහාරය අසළ පිහිටි රන්මසු උයන පොකුණ වේ.
2. අනුරාධපුර අභයගිරි විහාරභූමියේ පිහිටි කුට්ටම් පොකුණ වේ.
3. පොළොන්නරුවේ මහා පරාක්‍රමබාහු රජුගේ මගුල්උයනේ පිහිටි කුමාර පොකුණ වේ.
4. පොළොන්නරු යුගයේ දී මහා පරාක්‍රමබාහු රජතුමා ඉදිකරවූ නෙළුම් පොකුණ වේ.
5. අනුරාධපුර යුගයට අයත් ඇත් පොකුණ වේ.

04. D. අක්ෂරයෙන් දැක්වෙන කැටයම හමුවන්නේ,

1. ඉසුරුමුණි විහාරයෙන් හමුවී ඇති කැටයම් අතරින්ය.
2. ඉන්දියාවේ අජන්තා කැටයම් අතරින්ය.
3. යාපහුව දළදා මැදුරේ පාදමේ කැටයම් අතරින්ය.
4. ගඩලාදෙනිය විහාරයේ පාදමේ හමුවූ කැටයම් අතරින්ය.
5. ඉන්දියාවේ අමරාවතී චෛත්‍ය කැටයම් අතරින්ය.

05. E. අක්ෂරයෙන් දැක්වෙන කැටයම.

1. ඊජිප්තුකලාවේ හමුවූ පැරණි කලාකෘතිවලින් එකකි.
2. අල්ප උන්නත ක්‍රමයට කැටයම් කර ඇති හඳුනාගත නොහැකි කැටයමකි.
3. ඊජිප්තු කලා ශිල්පීන්ගේ හැකියාවන් විදහාදක්වයි.
4. ඊජිප්තු කලාශිල්පීන්ගේ සංකේත භාවිතය පිළිබඳ හැකියාව විදහාදක්වයි.
5. නාමර් රජුගේ යුධ ජයග්‍රහණ විදහාදක්වන සුවිශේෂී කැටයමකි.

- **ප්‍රශ්න අංක 06 සිට 10 තෙක් එක් එක් ප්‍රශ්නයට වඩාත් නිවැරදි පිළිතුර තෝරන්න.**

06. නිශ්චල ද්‍රව්‍ය සම්පිණ්ඩන ඇඳීමේ දී, එම වස්තූන්ගේ යථා ස්වරූපය ඉස්මතු කරවීමට අවධාරණය කරනු ලබන්නේ,

1. කල්පිත රූපවලට වඩා මතකයේ පවත්නා රූප ඇඳීමට පහසු නිසාය.
2. දකින දේ ඇඳීම දන්නා දේ ඇඳීමට වඩා පහසු නිසාය.
3. තමා ඉදිරියේ තබා ඇති වස්තූන්ගේ පරිමාණය වෙනස්කර අඳින බැවිනි
4. මතකයෙන් ඇඳීම නිසා අපූර්වත්වයෙන් යුතු නිර්මාණ බිහි නොවන නිසාය.
5. වස්තූන්ගේ ස්වභාවය හඳුනාගෙන එහි ඇති ගති ලක්ෂණ ප්‍රකාශ කිරීමේ හැකියාව පහසු වන නිසාය.

07. ගද්‍යයක හෝ පද්‍යයක අර්ථය වඩාත් තීව්‍ර ලෙස ඉදිරිපත් කර දැක්වීම සඳහා අඳිනු ලබන සිතුවම්,

1. ග්‍රැෆික් සිතුවම් ලෙස හඳුන්වයි.
2. ලිතෝමුද්‍රණ සිතුවම් ලෙස හඳුන්වයි.
3. පෝස්ටර් චිත්‍ර ලෙස හඳුන්වයි.
4. සන්නිදර්ශන චිත්‍ර ලෙස හඳුන්වයි.
5. ප්‍රකාශන චිත්‍ර ලෙස හඳුන්වයි.

08. සාම්ප්‍රදායික මෝස්තර අතර තිරුඅ සත්ව රූප කාණ්ඩයට අයත් වන සතුන් කාණ්ඩය වන්නේ,

1. භේරුණ්ඩ පක්ෂියා, ඇත්කඳලිහිණියා , සෙර පෙන්දා, මකරා යන සතුන් ය.
2. භේරුණ්ඩ පක්ෂියා, හංසයා, මකරා, ගජසිංහයා, යන සතුන් ය.
3. ගජසිංහයා, මකරා, භේරුණ්ඩ පක්ෂියා, ඇතා යන සතුන් ය.
4. අශ්වයා, මකරා, භේරුණ්ඩ පක්ෂියා, සෙරපෙන්දියා යන සතුන් ය.
5. ඇතා, අශ්වයා, සිංහයා, යාලි යන සතුන් ය.

09. බුද්ධ ප්‍රතිමා නෙලීමේ මුල්ම ගෞරවය හිමි වනුයේ

1. මථුරා ශිල්පීන්ටය. 2. මෞර්ය ශිල්පීන්ටය. 3. ගන්ධාර ශිල්පීන්ටය.
4. ගුප්ත ශිල්පීන්ටය. 5. අමරාවතී ශිල්පීන්ටය.

10. දියසායම් මාධ්‍ය භාවිතයේ දී,

1. වර්ණ ඝණව තිබිය යුතුය.
2. වර්ණ මිශ්‍ර නොකර භාවිතා කළ යුතුය.
3. වර්ණ තවරා සීරීම කළහැකිය.
4. විනිවිද පෙනෙන ආකාරයට වර්ණ එකමත එක තැවරිය යුතුය.
5. ඉහත සියල්ලම ක්‍රියාත්මක කළ හැක.

- **ප්‍රශ්න අංක 11 සිට 15 තෙක් ප්‍රශ්නවලට වඩාත් යෝග්‍ය පිළිතුර පහත දැක්වෙන F, G,H,I,J** ලෙස නම්කර ඇති රූප කොටස් ඇසුරින් තෝරන්න.







F G H I J

11. F අක්ෂරයෙන් දැක්වෙනුයේ පන්තුලිය බුද්ධ ප්‍රතිමාවයි. එම පිළිමය,

1. අමරාවතී කලා ලක්ෂණ අනුව නිමකර ඇත.
2. මතුරා කලා ලක්ෂණ අනුව නිමකර ඇත.
3. ගන්ධාර කලා සම්ප්‍රදායට අනුව නිමකර ඇත.
4. ගුප්ත කලා සම්ප්‍රදායට අනුව නිමකර ඇත.
5. පල්ලව කලා සම්ප්‍රදායට අනුව නිමකර ඇත.

12. G අක්ෂරයෙන් දැක්වෙන රූපය.

1. අවලෝකිතේශ්වර බෝධිසත්ව රූපයයි.
2. මාලා තාරා ප්‍රතිමාවයි.
3. ශිව සෝමස්කන්ද මූර්තියයි.
4. නටරාජ මූර්තියයි.
5. අර්ධනාරී නටේශ්වර ප්‍රතිමාවයි.

13. H අක්ෂරයෙන් දැක්වෙන ප්‍රතිමාව.

1. තක්තිබහීර් පිළිමය ලෙස හඳුන්වයි.
2. හෝර්ට් මන්දාර් පිළිමය ලෙස හඳුන්වයි.
3. කණිෂ්ක රජු නිම කෙරු පිළිමයයි.
4. සහරි බහ්ලොල් පිළිමයයි.
5. බේ‍රගම් පිළිමය ලෙස හඳුන්වයි.

14. I අක්ෂරයෙන් දැක්වෙන මූර්ති කොටස,

1. ඉන්දු නිම්න ශිෂ්ටාචාරයට අයත් කලාකෘතියකි.
2. මිසර ශිෂ්ටාචාරයට අයත් කලාකෘතියකි.
3. ඉන්දීය මෞර්ය කලාකෘති අතර හමුවූ ලෞරියා නන්දන්ගර් ස්ථම්භයේ කොටසකි.
4. අනුරාධපුර යුගයට අයත් වාහල්කඩ කැටයමක කොටසකි.
5. ඉන්දීය මෞර්ය කලාකෘති අතර හමුවූ සාරානාත් ස්ථම්භයේ කොටසකි.

15. J අක්ෂරයෙන් දැක්වෙන මූර්තිය,
1. මිසර ශිෂ්ටාචාරයෙන් හමුවූ ස්ක්‍රයිබ් මූර්තිය ලෙස හඳුන්වයි.
2. ඊජිප්තු කලකෘති අතර හමුවූ මෙන්කුරේ නම් වූ මූර්තියයි.
3. ඉන්දු නිම්න ශිෂ්ටාචාරයෙන් හමුවූ පූජක රූපයකි.
4. අනුරාධපුර යුගයට අයත් පැරණි මූර්තියකි.
5. ඉන්දු නිම්න ශිෂ්ටාචාරයට අයත් රතුවැලිගලින් නිමකළ මිනිස්කවන්ද රුව නැමති මූර්තියයි.

- අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවලට ඊට ඉදිරියෙන් දක්වා ඇති වාස්තුවිද්‍යා නිර්මාණ ඇසුරින් වඩාත් නිවැරදි පිළිතුර තෝරන්න.

16. මෙහි දැක්වෙන වාස්තුවිද්‍යා අංගය.



1. මිහින්තලයේ කණ්ඨක චෛත්‍යයයි.
2. අනුරාධපුර අභයගිරි චෛත්‍යයයි.
3. පොළොන්නරු රන්කොත් වෙහෙරයි.
4. පොළොන්නරු කිරිවෙහෙරයි.
5. හගුරන්කෙත පොත්ගුල් විහාරයේ පිහිටි චෛත්‍යයයි.

17. මෙහි දැක්වෙන වාස්තුවිද්‍යා නටඹුන් කොටසින් දැක්වෙන්නේ,



1. ත්‍රිකුණාමලයේ පුලුකුනාව ආසන ඝරයේ කොටසකි.
2. අරංකැලේ ජන්තාඝරයේ කොටසකි.
3. නිල්ලක්ගම බෝධිඝරයේ කොටසකි.
4. අනුරාධපුර පශ්චිමාරාමයේ පධානඝරයේ කොටසකි.
5. මහනුවර යුගයට අයත් බෝධිඝරයක කොටසකි.

18. මෙම ඡායාරූපයෙන් දැක්වෙන්නේ,



1. හෙලනිස්ටික් යුගයට අයත් ග්‍රීක දේවස්ථානයකි.
2. මිසර නවරාජධානි යුගයේ 11 වන රැමෙසස් රජු විසින් ඉදිකරන ලද ගොඩනැගිල්
3. ඉන්දුනිම්න ශිෂ්ටාචාරයට අයත් ගොඩනැගිල්ලකි.
4. ක්‍රි.පූ 1400 දී නයිල් ගඟේ නැගෙනහිර නිම්නයේ ඉදිකරන ලද දේවස්ථානයකි.
5. අමර්නා යුගයට අයත් ඊජිප්තු දේවස්ථානයකි.

19. මෙහි දැක්වෙන පල්ලව කලා නිර්මාණවලට අයත් වාස්තු විද්‍යා අංගය.



1. භීම රථ දේවාලය ලෙස හඳුන්වයි.
2. නකුල සහ සහදේව රථ දෙවොල ලෙස හඳුන්වයි.
3. වෙරළේ දේවාලය ලෙස හඳුන්වයි.
4. අර්ජුන රථ දේවාලය ලෙස හඳුන්වයි.
5. රාජ රාජේශ්වර දේවාලය ලෙස හඳුන්වයි.

20. මෙම කලාත්මක ගෘහනිර්මාණ අංගය,




1. ගම්පොල යුගයේ ඉදිකරන ලද ගඩලාදෙණි විහාරයට අයත් ගෘහනිර්මාණ අංගයකි.
2. මහනුවර දළදා මාලිගයට අයත් ගෘහ නිර්මාණය අංගයකි.
3. අනුරාධපුර රාජධානි සමයේ ඉදිකළ සීගිරි රාජධානියට අයත් ගෘහනිර්මාණ අංගයකි.
4. යාපහුව රාජධානි සමයට අයත් ගෘහනිර්මාණ අංගයකි.
5. අනුරාධපුර පැරණි රාජධානියට අයත් ගෘහනිර්මාණ අංගයකි.

- අංක 21 සිට 25 දක්වා ප්‍රශ්නවලට පහත දී ඇති K.L.M.N.O යන රූප ඇසුරුකර ගනිමින් පිළිතුරු සපයන්න.


K


L


M


N


O

21. මෙරට චිත්‍රශිල්පීන් අතරින්, 43 කණ්ඩායමට අයත් ශිල්පීන්ගේ සිතුවම් ලෙස නම්කළ හැක්කේ,

1. K,L 2. L,N 3. K,M 4. N,O 5. M, N

22. යුරෝපීය නූතනවාදී ශිල්පීන්ගේ ඝනිකවාදී ප්‍රකාශනවාදී, චිත්‍රකලා ලක්ෂණ සහ දේශීය සාම්ප්‍රදායික කලාවන්ගේ ලක්ෂණ (බලි/කෝලම්) ඇසුරින් නිර්මාණය කරන ලද සිතුවම වන්නේ,

1. M 2. O 3. L 4. K 5. N

23. ශාස්ත්‍රාලීය යථාර්ථවාදී ලක්ෂණ වලින් ඈත්ව, නූතනවාදී කලාත්මක ප්‍රයෝග භාවිතාකරමින් දියසායම් මාධ්‍යයෙන් අඳිනලද සිතුවම වන්නේ,

1. M 2. L 3. O 4. K 5. N

24. ඉන්දියානු ස්වදේශික කලා ශෛලීන් හා යුරෝපීය නූතන කලා ශෛලිය මිශ්‍රකොට අඳින ලද සිතුවම වන්නේ,

1. O 2. K 3. L 4. N 5. M

25. උපවිඥානගත ආවේශයන්ගෙන් පැන නැගුණු තේමා ලෙස අත්භූත භාවය, තාර්තිකත්වය, ස්වප්නමය ස්වභාවය, අතිශයෝක්තිය තේමාකර ගනිමින් අඳින ලද සිතුවම වන්නේ,

1. K 2. O 3. N 4. M 5. L

- **අංක 26 සිට 30 දක්වා දී ඇති එක් එක් ප්‍රශ්නයට වඩාත් නිවැරදි පිළිතුරු තෝරන්න.**

26. මහනුවර යුගයේ උඩරට සම්ප්‍රදායට අයත් සිතුවම් අතර සුවිශේෂී කරුණක් වන තුවක්කුවක් අතින්ගත් මාරයෙකු දැක්වෙන්නේ,

1. හිඳගල විහාරයේ සිතුවම් අතරය. 2. මැදවල ටැම්පිට විහාර සිතුවම් අතරය.
3. දෙගල්දොරුව විහාර සිතුවම් අතරය. 4. දළදා මාලිගාවේ සිතුවම් අතරය.
5. මුල්කිරිගල විහාර සිතුවම් අතරය.

27. යුරෝපයේ ප්‍රාග්ඓතිහාසික සිතුවම් පිළිබඳ අවධානය යොමුකිරීමේ දී දක්නට ලැබෙන විශේෂ ලක්ෂණය වන්නේ,

1. සෑම රූපයක්ම වර්ණගන්වා තිබීමයි.
2. වල් අශ්වයන්, බයිසන් ගව රූප බහුලව ඇඳ තිබීමයි.
3. සතුන් වේගයෙන් දුවන පනින චලන ඉරියව් ඇඳතිබීමයි.
4. සතුන්ගේ ස්වභාවික පරිමාණයේ රූප ඇඳතිබීමයි.
5. සතුන්ගේ කොටස් අධ්‍යයනය කරමින් දළ සටහන් ඇඳතිබීමයි.

28. ඉන්දු නිම්න ශිෂ්ටාචාරයෙන් හමුවූ ලෝකඩ මූර්තිය වන්නේ,

1. පූජක රූපයයි. 2. කවන්ද මිනිස් රූපයයි. 3. නලඟන රූපයයි.
4. මාතෘ දෙවඟන රූපයයි.
5. නර්තන විලාශයෙන් දැක්වෙන කවන්ද මිනිස් රූපයයි.

29. බටහිර ශාස්ත්‍රාලීය කලාව ඉක්මවා ඝනිකවාදී කලා සම්ප්‍රදායන් බිහිකිරීමට මූලික වූ ශිල්පියා වන්නේ,

1. ක්ලෝඩ් මොනේ ශිල්පියාය. 2. සැල්වදෝර් ඩාලි ශිල්පියාය.
3. පැබ්ලෝ පිකාසෝ ශිල්පියාය. 4. එඩුවාඩ් මැනේ ශිල්පියාය.
5. වසිලි කැන්දිනෙස්කි ශිල්පියාය.

30. පෝස්ටර් චිත්‍රයක් නිර්මාණය කිරීමේ දී අවධානයට ලක්කළ යුතු විශේෂ කරුණක් වන්නේ,

1. පෝස්ටර් චිත්‍රය ඇඳීමට පෙර දළ සටහන් ඇඳීමයි.
2. පෝස්ටර් චිත්‍රය ඇඳීම සඳහා ජ්‍යාමිතික උපකරණ භාවිතා කිරීමයි.
3. අදාළ තේමාව ඉස්මතු වන ආකාරයට අක්ෂර සහ පාඨය , චිත්‍ර, වර්ණ, පිළිබඳව අවධානය යොමු කිරීමයි.
4. පෝස්ටරය වටා රාමුවක් නිර්මාණය කිරීමයි.
5. පෝස්ටරයේ චිත්‍රය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කිරීමයි.

- අංක 31 සිට 35 දක්වා අසා ඇති ප්‍රශ්නවලට වඩාත් නිවැරදි පිළිතුර U, V,W, X,Y ලෙස නම්කර ඇති පහත සඳහන් රූප ඇසුරින් තෝරන්න.


U


V


W


X


Y

31. U අක්ෂරයෙන් දැක්වෙන, චිත්‍ර ශිල්පී එල් ග්‍රෙගෝ ගේ සහ මොන්ඩියන්ගේ චිත්‍රවල ආභාසය ලබමින් ''ගල්කිස්ස'' නැමති සිතුවම අඳින ලද ශිල්පියා,

1. හැරීපීරිස් ශිල්පියාය. 2. අයිවන් පීරිස් ශිල්පියාය. 3. ජස්ටින් දැරණියගල ශිල්පියාය.
4. රිචඩ් ග්‍රේබ්‍රියල් ශිල්පියාය. 5. ඩබ්.ජේ.ජී.බීලිං ශිල්පියාය.

32. V අක්ෂරයෙන් දැක්වෙන යුරෝපීය නූතනවාදී කලාවේ ආභාසයෙන් නිර්මාණකරණයේ නියැලී, ඉවතලන ද්‍රව්‍ය ඇසුරින් නිර්මාණය කරන ලද ''මිනිසා සහ බල්ලන්'' නැමති නිර්මාණය බිහිකළ ශිල්පියා වන්නේ,

1. ස්ටැන්ලි අබේසිංහ ශිල්පියාය. 2. ඒ.මාක් ශිල්පියාය. 3. තිස්ස රණසිංහ ශිල්පියාය.
4. හෙන්රි මුවර් නැවති ශිල්පියාය. 5. ඉන්දීය චිත්‍ර ශිල්පිනියක වන අම්රිතා ශර්ගිලය

33. W අක්ෂරයෙන් දැක්වෙන මූර්තිය තුළින්,

1. ත්‍රාසය හා බිය ප්‍රකාශ වේ.
2. මිනිස් සිරුරේ සෞන්දර්ය ප්‍රකාශ වේ.
3. ග්‍රීක මූර්ති තුළ පවතින භාව ප්‍රකාශනය ඉස්මතු වේ.
4. මිනිස් සිරුරේ ක්‍රියාකාරී බව ප්‍රකාශ වේ.
5. දේවත්වයට ගරුකිරීම ප්‍රකාශ වේ.


34. X අක්ෂරයෙන් දැක්වෙන මෙම සිතුවම ස්වභාවික හා ශෛලිගත යන දෙයාකාරයටම නිර්මාණය කොට ඇත. මෙයින් ස්වභාවික ලෙස නිර්මාණය කරන ලද රූප කොටස් වනුයේ,

1. පැපිරස් පඳුරු සහ වංශාධිපතියාය. 2. සමනලයා,මාළුවා,බළලා ය.
3. මෙහි දැක්වෙන වංශාධිපතියා සහ ඔහුගේ දියණියයි. 4. වංශාධිපතිගේ බිරිඳ සහ මාළුවාය.
5. වංශාධිපතියාගේ දියණිය සහ පක්ෂිරූපයකි.

35. Y අක්ෂරයෙන් දැක්වෙන රූපය.

1. කථළුව විහාරයේ සිතුවමකි. 2. මුල්කිරිගල විහාරයේ සිතුවමකි.
3. දඹුලු විහාරයේ සිතුවමකි. 4. කරගම්පිටිය සුබෝධාරාමයේ සිතුවමකි.
5. තෙල්වත්ත රජමහා විහාරයේ සිතුවමකි.

- අංක 36 සිට 40 දක්වා අසා ඇති ප්‍රශ්නවලට වඩාත් නිවැරදි පිළිතුර **පහත සඳහන් චිත්‍රය ඇසුරෙන් තෝරන්න.**



36. මෙම සිතුවම දක්නට ලැබෙන්නේ,

1. බොරැල්ලේ ගෝතමී විහාරයේය.
2. කොළඹ අශෝකාරාමයෙහිය.
3. පොතුපිටියේ පූජාරාමයෙහිය.
4. බෙල්ලන්විල විහාරයෙහිය.
5. කැළණි නවබුදු මැඳුරෙහිය.

37. මෙම සිතුවම නිර්මාණය කරන ලද ශිල්පියා වන්නේ,

1. එම්. සාර්ලිස් ශිල්පියාය.
2. සෝලියස් මෙන්ඩිස් ශිල්පියාය.
3. ඒ.සී.ජී.එස්.අමරසේකර ශිල්පියාය.
4. සෝමබන්දු විද්‍යාපති ශිල්පියාය.
5. ඩේවිඩ් පෙන්ටර් ශිල්පියාය.

38. මෙම සිතුවමින් ප්‍රකාශ කරනුයේ,

1. සිද්ධාර්ථ කුමරුන්ගේ සරණ මංගල අවස්ථාවයි.
2. ගිහිගෙයින් නික්මෙන අවස්ථාවයි.
3. සිදුහත් කුමරු මාලිගාවේ අන් අය සමඟ සතුටු සාමීචියේ යෙදී සිටින අවස්ථාවකි.
4. සිදුහත් කුමරු පිරිවරා සිටින නාට්‍යාංගනාවන් දැක්වෙන අවස්ථාවයි.
5. රජකුමරකු හා කුමරියක අතර සාකච්ඡාවක් නිරූපණය වන අවස්ථාවකි.

39. මෙම සිතුවම නිර්මාණය කිරීමේ දී ශිල්පියා වර්ණ භාවිතාකර ඇත්තේ,

1. ඉතා උණුසුම් වර්ණමාලාවක් යොදා ගනිමිනි.
2. තේමාවට අදාළව ආගමික පසුබිමක් නිර්මාණය වන ආකාරයටය.
3. සිතුවමට නොගැලපෙන වර්ණ මාලාවක් භාවිතාකර ගනිමිනි.
4. ඉන්දීය චිත්‍ර ශිල්පී නන්දලාල් බෝස්තුමාගේ වර්ණමාලා අනුකරණය කරමිනි.
5. ඉතා සෞම්‍ය වර්ණ මාලාවක් භාවිතා කර ගනිමිනි.

40. මෙම සිතුවමේ දක්නට ලැබෙන මානව ඉරියව් ,

1. කලබලකාරී ස්වභාවයක් පෙන්නුම්කරයි.
2. ස්ථානයට උචිත ආකාරයට සංයමයෙන් සිටින අයුරු දක්වා ඇත.
3. ගෞරවය,භක්තිය හා ශ්‍රද්ධාව ඉස්මතු කරයි.
4. සෑම පුද්ගලයෙකුම එක සමාන ප්‍රමාණයට දැක්වෙන ආකාරයට මාංශ පේශී දක්වා ඇත.
5. සිතුවම මධ්‍යයේ සිදුකෙරන ක්‍රියාකරකම වෙත අවධානය යොමු කර සිටින සේ නිමකර ඇත.

**එක් පිළිතුරකට එක් ලකුණක් හිමිවේ. ලකුණු 40**

## II – කොටස

- මෙම කොටස අනුකොටස් තුනකින් සමන්විත වේ.
- ''අ'' කොටසින් ප්‍රශ්න දෙකක් හා ''ආ'' සහ ''ඉ'' කොටස් දෙකෙන් එක් ප්‍රශ්නය බැගින් තෝරාගෙන ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.
  (අවශ්‍ය තැන්වල පිළිතුරු සචිත්‍රකිරීම ඔබට වාසිදායක වේ.)

### "අ" - කොටස
### (චිත්‍ර කලාව ඇගයීම හා රසාස්වාදය - ශ්‍රී ලංකාව)

01. ලංකා කලා ඉතිහාසයේ ගම්පොළ යුගයට හිමිවනුයේ සුවිශේෂී ස්ථානයකි. එසේ වන්නේ, එම යුගයට ආවේණික වූ වාස්තු විද්‍යා නිර්මාණය සහ කැටයම් කලාව ඒ සඳහා හේතු වූ බැවිනි.

i. ගම්පොල යුගයට හා මහනුවර යුගයට අයත් දැව කැටයම් සහිත වාස්තු විද්‍යා නිර්මාණ (ගොඩනැගිලි) දෙකක් නම් කරන්න.
(ලකුණු -2)

ii. ඔබ නම්කරන ලද එක් ස්ථානයක දක්නට ලැබෙන දැව කැටයම් තුනක් පිළිබඳව කෙටි සටහන් ලියන්න.
(ලකුණු -5)

iii. ඔබ තෝරාගත් එක් ස්ථානයක වාස්තුවිද්‍යාත්මක අගය දක්වමින් නිදසුන් සහිතව විග්‍රහයක යෙදෙන්න.
(ලකුණු -8)

02. අනුරාධපුර රාජධානි සමයෙන් පසුව පොළොන්නරුව ලංකාවේ දෙවන රාජධානිය බවට පත්විය. ක්‍රි.ව 993 දී පොළොන්නරු රාජධානිය දකුණු ඉන්දීය චෝල බලයට නතුවිය.

i. පොළොන්නරු යුගයේ දී හමුවූ හින්දු මූර්ති දෙකක් නම් කරන්න. (ලකුණු -2)
ii. ඔබ කැමති එක් හින්දු මූර්තියක් පිළිබඳව කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු -5)
iii. පොළොන්නරු යුගයේ දී දකුණු ඉන්දීය චෝල ගෘහනිර්මාණ කලාව එකල ඉදිවූ බෞද්ධ ගොඩනැගිලි කෙරෙහිද බලපා ඇත.මේ පිළිබඳව නිදසුන් සහිතව විස්තර කරන්න. (ලකුණු -8)

03. ශ්‍රී ලංකාවේ ප්‍රාග්ඓතිහාසික යුගයේ සිටම එකළ විසූ මානවයා චිත්‍ර කලාව කෙරෙහි වැඩි නැඹුරුවක් දක්වා ඇතිබව එම ස්ථාන නිරීක්ෂණය කිරීමේ දී සනාථ වේ. අනුරාධපුර යුගය වනවිට චිත්‍ර කලාව කෙරෙහි සුවිශේෂි අවධානයක් යොමු කොට ඇති බව නටබුන් ඇසුරින් අවබෝධ කොටගත හැක.

i. අනුරාධපුර යුගයට අයත් සිතුවම් දක්නට ලැබෙන ස්ථාන දෙකක් නම් කරන්න. (ලකුණු - 2)
ii. ඔබ සඳහන් කළ ස්ථාන දෙකෙන් එක් ස්ථානයක සිතුවම් පිළිබඳ කෙටි විස්තරයක් කරන්න. (ලකුණු - 5)
iii. අනුරාධපුර හා පොළොන්නරු යුගයේ දී සිතුවම් කලාව අතර දක්නට ලැබෙන සමාන හා අසමානතා පිළිබඳව නිදසුන් සහිතව විස්තර කරන්න. (ලකුණු - 8)

**"ආ" - කොටස**
**(චිත්‍ර කලාව ඇගයීම හා රසාස්වාදය - ඉන්දියාව)**

04. 16 වන සියවසේ මුස්ලිම් පාලනය ආරම්භ වීමත් සමගම මෝගල් චිත්‍ර කලාව නව කලා සම්ප්‍රදායක් ලෙස භාරතය තුළ ආරම්භ විය.

i. මෝගල් චිත්‍ර කලාව සඳහා යොදාගන්නා ලද තේමාවන් හතරක් ලියන්න. (ලකුණු - 2)
ii. අක්බාර් රාජ සමයේ මෝගල් චිත්‍ර කලාවට සිදුවූ මෙහෙය කෙටියෙන් පහදන්න. (ලකුණු - 5)
iii. මෝගල් රාජ සමයේ පාලකයෙකු වූ සාජහන් රජුට චිත්‍ර කලාව වෙනුවෙන් වැඩි මෙහෙවරක් සිදුකළ නොහැකි වුවද, වාස්තු විද්‍යාත්මක නිර්මාණ සඳහා වැඩි දායකත්වයක් ලබා දීමට හැකි විය. මෙම කියමන පිළිබඳ ඔහුගේ වාස්තු විද්‍යා නිර්මාණ ඇසුරින් පහදන්න. (ලකුණු - 8)

05. ඉන්දීය කලා ඉතිහාසයේ අගනා කලාකෘති රැසකට හිමිකම් කියන පල්ලව කලාසම්ප්‍රදාය දකුණු ඉන්දියාව නිජ බිම කරගනිමින් බිහිවිය. ක්‍රි.ව 4 - 9 සියවස් අතරකාලය තුළ මෙම කලා සම්ප්‍රදාය ව්‍යාප්ත වී තිබුණි.

i. පල්ලව කලාසම්ප්‍රදායට, අයත් වාස්තු විද්‍යාව ප්‍රධාන වශයෙන් බෙදා දැක්විය හැකි කොටස් දෙක නම් කරන්න. (ලකුණු - 2)
ii. පල්ලව කලා සම්ප්‍රදායට අයත් ''වෙරළේ දේවාලය'' පිළිබඳව කෙටියෙන් පහදන්න. (ලකුණු - 5)
iii. ''ආකාශ ගංගාවරෝහණය'' පල්ලව අවධියේ නෙලන ලද ඉතා සිත්ගන්නාසුළු මූර්තිමය සංරචනයකි. මෙහි වස්තු විෂය, ශෛලිය, ඇසුරින් කලාත්මක විග්‍රහයක යෙදෙන්න. (ලකුණු - 8)

**"ඉ" - කොටස**
**(චිත්‍ර කලාව ඇගයීම හා රසාස්වාදය - යුරෝපය)**

06. රෝම කලාව ග්‍රීක කලාව ගුරුකොටගෙන වර්ධනය වූවක් ලෙසට ප්‍රකට වුවද ඔවුන්ට ආවේණික වූ ලක්ෂණ රෝම මූර්ති කලාව හා චිත්‍ර කාලව තුළ ගැබ්ව ඇත.

i. රෝම කලාවට අයත් ප්‍රසිද්ධ මූර්ති දෙකක් නම් කරන්න. (ලකුණු - 2)
ii. ඉහත ඔබ සඳහන් කරන ලද මූර්ති දෙකෙන් එක් මූර්තියක් පිළිබඳව සැකවින් දක්වන්න. (ලකුණු - 5)
iii. රෝමවරුන්ගේ යුධ ජයග්‍රහණයන් සිහිවීම පිණිස ඉදිකළ නිර්මාණ, ඔවුන්ගේ අභිමානවත් සිහිවටනයන් ලෙස සැලකේ, ඒ සඳහා ඔවුන් විසින් ඉදිකරන ලද කුළුණු හා ස්මාරක නිදසුන් ලෙස දක්වමින් ඉහත කරුණ සනාථ කර දක්වන්න. (ලකුණු - 8)



Downloaded from Past Papers Wiki - Most Extensive Wikipedia of Past Papers!

07. 19 වන සියවසේ පැරීසිය මුල්කර ගනිමින් චිත්‍ර කලාව පිළිබඳ නිදහස් මතධාරී කලාකරුවන් පිරිසක් විසින් චිත්‍ර කලාවේ නව මානයක් ඔස්සේ අත්හදා බැලීම් සිදුකිරීම හේතු කොටගෙන උපස්ථිතිවාදී චිත්‍ර කලාව බිහිවිය.

i. උපස්ථිතිවාදි චිත්‍ර ශිල්පීන් දෙදෙනෙකු නම් කරන්න. (ලකුණු - 2)

ii. ඔබ කැමති එක් උපස්ථිතිවාදි චිත්‍ර ශිල්පියෙකු ගේ නිර්මාණයක් පිළිබඳව සැකවින් දක්වන්න. (ලකුණු - 5)

iii. උපස්ථිතිවාදි හා පශ්චාත් උපස්ථිතිවාදි චිත්‍ර කලාව අතර දක්නට ලැබෙන වෙනස්කම් පිළිබඳව නිදසුන් සහිතව පහදන්න. (ලකුණු - 8)

PAST PAPERS WIKI



Downloaded from Past Papers Wiki - Most Extensive Wikipedia of Past Papers!




කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් සඟරා | O/L ප්‍රශ්න පත්‍ර | A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත් | School Book ගුරු අතපොත්

PADANAMA PUBLICATION | pesuru Prakashana Private Ltd. | Akura Pilot | සමනල දැනුම | T | සතර

පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා

**සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට**

**www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න**